"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம் ,32, ஸ்ரீமத் மார்க்கஸ் பர்னாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary — දුරකථන / தொலைபேசி / Telephone - 2698409; ෆැක්ස් / பெக்ஸ் / Fax - 2694667; ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி / General Telephone — 2682868, 2682869, 2682870

මගේ අංකය / எனது இல. / My No. CSO/FIN/6/6/9/2017 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2017.10. 25

## මුල්‍ය චක්‍රලේඛ 6 /2017

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
සියළුම අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප),
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්(බ.ප.),
සභා ලේකම්(බ.ප.),
සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්(බ.ප.),
ප්‍රධාන ලේකම් කාර්යාලයේ සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්(බ.ප.),
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් (බ.ප.),
ප්‍රාදේශීය ලේකම්වරුන්(බ.ප.),

### 2017 වර්ෂයේ ගිණුම් පියවීම

2017 මුදල් වර්ෂය තුළ වියදම් දැරීම සඳහා දී ඇති වොරන්ට් බලපත්‍රයේ අධිකාරී බලය 2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන හෙයින් වැඩ, සැපයීම් හා සේවාවන් සඳහා ගෙවීමට ඇති මුදල් එම අධිකාරී බලය ඉක්මවීමට පෙර ගෙවා නිම කිරීම අත්‍යවශ්‍ය කරුණකි. පුද්ගලයන්, ආයතන, දෙපාර්තමේන්තු හා සංස්ථා මගින් ඉටු කරවා ගන්නා ලද වැඩ සැපයීම් හා සේවාවන්ට අදාළ බිල්පත් නියමිත පරිදි ගෙන්වා ගෙන මුදල් වර්ෂය අවසන් වීමට පෙර නිරවුල් කිරීම පිණිස එහි සේවාවන් ලබා ගත් හෝ ඇණවුම් කළ හෝ නිලධාරීන් විසින් අවශ්‍ය පියවර ගත යුතුය.

02. ඔබගේ අධීක්ෂණය යටතේ ඇති අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/කාර්යාල/ආයතන වල 2017 දෙසැම්බර් මස ගිණුම් පියවීම පිලිබඳව කටයුතු කිරීමේදී ඇතිවන තදබදය අඩු කිරීම සඳහාත්, ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහාත් පහත සඳහන් ක්‍රියා මාර්ග අනුගමනය කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

03. (අ) **විසර්ජන ලෙජරය**

I. 2017 වර්ෂයේ නිම කර ඇති සැපයීම් සේවාවන් හා වැඩ සඳහා අදාළ සියළුම ගෙවීම් 2017 දෙසැම්බර් මස 31 දිනට පෙර ගෙවා අවසන් කළ යුතුව ඇති බැවින්, ඔබ මගින් පාලනය වන කාර්යාල වල හා ආයතන වල සියළුම වවුචර්, බිල්පත් ඉහත දිනට පෙර ගෙවා අවසන් කිරීමට පියවර ගැනීම.

II. වෙන් කර දී ඇති මුදල් ප්‍රතිපාදනයන් ගේ සීමාවන් නොඉක්මවන බවට සෑහීමට පත්වීම.



| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුල්‍ය / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන / பணிப்பாளர் (உள்ளக கணக்காய்வு) / Director Internal Audit |
|---|---|---|---|---|---|---|
| | Tel: 2693964<br>Fax:2669479<br>dcsadmin@cs.wpc.gov.lk | Tel: 2690058<br>Fax:2693952<br>dcspt@cs.wpc.gov.lk | Tel: 2693978<br>Fax:2679958<br>csfinance@wpc.gov.lk | Tel: 2693970<br>Fax:2676280<br>dsplancs@wpc.gov.lk | Tel: 2693968<br>Fax:2689899<br>dsengcs@wpc.gov.lk | Tel: 2689011<br>Fax:2689011 |

III. පවත්නා වූ මුදල් වර්ෂයේ කළ යුතු ගෙවීම් අවසන් කළ වහාම 2017 දෙසැම්බර් 31 දිනට හිඟව පවතින බැරකම් / බැඳීම් පිළිබඳ ව පහත සඳහන් විස්තර ඇතුළත් ප්‍රකාශනයක් පිළියෙල කිරීම.

(අ). ගෙවීම් ලබන්නාගේ නම
(ආ). වැඩ, සේවාවන් සැපයීම් පිළිබඳ විස්තර
(ඇ). ගෙවිය යුතු නියම මුදල හෝ දල මුදල
(ඈ). පවත් නා වර්ෂයේ වැය විස්තර

(ආ) **ගමන් වියදම්**

I. 2017 නොවැම්බර් මස 30 වැනි දින දක්වා ඉටු කර ඇති රාජකාරි ගමන් හා ස්ථාන මාරුවීම් වෙනුවෙන් අදාළ ගමන් වියදම් ඉල්ලීම් නො පමාව ලබා ගෙන 2017 දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර ගෙවා නිම කිරීම.

II. 2017 දෙසැම්බර් මාසය තුළ දී කරනු ලබන රාජකාරි ගමන් වලට අදාළ ගෙවීම් ද හැකි පමණ දෙසැම්බර් 31 දිනට පෙර ගෙවා නිම කිරීම.

III. 2017.11.30 වැනි දිනට පෙර ගෙවා ඇති ගමන් වියදම් අත්තිකාරම් සියල්ල 2017.12.15 දිනට පෙර නිරවුල් කරවා ගැනීම.

IV. 2017 දෙසැම්බර් මාසය තුළ ගමන් වියදම් අත්තිකාරම් ගෙවීමේ දී ඒවා එම මාසය තුළදීම ආපසු අය කිරීමේ හැකියාව පිළිබඳ ව සෑහීමකට පත්වී ගෙවීම හා එම මාසය තුළදීම අයකර ගැනීම.එසේ අයකර ගැනීම අපහසු නම්, එවැනි අත්තිකාරම් නොගෙවා සිටීමට වග බලා ගත යුතු ය.

(ඇ) **තැන්පත් ලෙජරය**

I. ආපසු ගෙවීමට සුදුසුකම් ලබා ඇති සියළුම තැන්පත් මුදල් ආපසු ගෙවීම.

II. ටෙන්ඩර් තැන්පත්, ඇප තැන්පත්, හා විවිධ තැන්පත් ගිණුම් ආදී උප ගිණුම් වල 2017.12.31 දිනට ශේෂය තනි තනි ශේෂ වල (කේවල ගිණුම් වල) එකතුව සමග 2018 පෙබරවාරි මස 16 දිනට පෙර සැසඳීම.

III. සියළුම තැන්පත් ගිණුම් තුලනය කර 2018 වර්ෂයේ අලුත් ලෙජර් වලට ශේෂ ඉදිරියට ගෙන යා යුතු අතර, එම සටහන් වගකිවයුතු නිලධාරියෙකු විසින් පරීක්ෂා කර කෙටිසන යෙදීම මගින් සනාථ කිරීම කළ යුතුය.ශේෂය 2018 වර්ෂයට ගෙන යාමට පෙර තැන්පත් ලෙජර් වල තව දුරටත් රජයට ගෙවිය යුතු මුදල් (වැ.අ.වි.වැ.ආදී) හා පළාත් සභා අරමුදලට බැර විය යුතු ආදායම් තිබේ නම් ඒවා තැන්පත් ගිණුම් වලින් ඉවත් කර නිරවුල් කළ යුතු වේ.

(ඈ) **විවිධ ඇණවුම්**

රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හා මණ්ඩල වලට නිකුත් කර ඇති ඇණවුම් වෙනුවෙන් ලබා ගත යුතු භාණ්ඩ සහ සැපයීම් නොපමාව ලබා ගැනීමට හා ඊට අදාළ බිල්පත් නිරවුල් කිරීමට ද නොපමාව ක්‍රියා කිරීම. භාණ්ඩ සහ සැපයීම් ලබා ගැනීම සඳහා අත්තිකාරම් මුදල් ලබා ගෙන ඇති අවස්ථාවන්හිදී, එම භාණ්ඩ හා සැපයීම් 2017.12.15 වැනි දිනට පෙර ලබා ගෙන අදාළ වවුචර් 2017.12.31 දිනට පෙර නිරවුල් කිරීම

(ඉ) **දුම්රිය බිල්පත්, විදුලි බිල්පත්, දුරකථන හා වෙනත් ගෙවීම්**

දැනට ලැබී ඇති බිල්පත් පරික්ෂා කර වහාම නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කළයුතු අතර, **ලැබී නොමැති බිල් පත්‍ර ලබා ගෙන නිරවුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.**

(ඊ) **ඉන්ධන බිල්පත්**

2017 නොවැම්බර් මස 30 වැනි දින දක්වා සපයා ඇති ඉන්ධන වෙනුවෙන් ගෙවීමට ඇති බිල්පත් නොපමාව ගෙන්වා ගෙන ඒවා 2017 දෙසැම්බර් 15 වැනි දිනට පෙර ගෙවා නිම කිරීම හා 2017 දෙසැම්බර් මාසයේ සැපයීම් වෙනුවෙන් වූ බිල්පත් ද ලබා ගැනීමට හැකි නම් එසේ ලබා ගෙන ඒවාද දෙසැම්බර් මාසය තුළ නිරවුල් කිරීම. ඉන්ධන අත්තිකාරම් ලබා දී තිබේ නම්, එම අත්තිකාරම් දෙසැම්බර් බිලට හිලව් කිරීමට හෝ පියවා ගැනීමට ක්‍රියා කිරීම.

(උ) **අතුරු අග්‍රිම හා අත්තිකාරම්**

ඉදිරිපත් කරන වවුචර් සඳහා නොපමාව ගෙවීම් කිරීමට අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුය. අත්තිකාරම් පියවීම සඳහා ගෙවීම් කිරීමට ඉදිරිපත් කරන වවුචර් ඇතැම් අවස්ථා වලදී අදාළ විෂයභාර මාණ්ඩලික නිලධාරීන් වෙත හා ලිපිකරු නිලධාරීන් වෙත රැඳී තිබෙන්නට හැකි හෙයින්, ඒ පිළිබඳව ද අවධානයකින් යුතුව කටයුතු කිරීමට සටහන් කර ගන්න. ලැබෙන ලිපි අප්‍රමාදව නියමිත අංශ වලට යොමු කරන ලෙසට තැපැල භාර නිලධාරීන්ට උපදෙස් දෙන්න.

I. අතුරු අග්‍රිම හා විශේෂ අත්තිකාරම්
කිසියම් විශේෂ කාර්යයක් සඳහා අත්තිකාරම් දී තිබේ නම්, ඒවා 2017.12.31.දිනට පෙර නිරවුල් කරවා ගැනීමට කටයුතු කළ යුතුය.

II. උප අක්මුදල්
තම කාර්යාලයේ තැපැල් වියදම් ආදී කටයුතු සඳහා කිසියම් නිලධාරියෙකුට සුළු මුදල් අග්‍රිම දී ඇත්නම් 2017 දෙසැම්බර් මස 31 දිනට පෙර පියවා ගැනීමට කටයුතු කළ යුතුය.

III. මොනයම් හේතුවක් නිසාවත් උප අක්මුදල් හෝ අත්තිකාරම් මුදල් වලින් කොටසක් 2017 දෙසැම්බර් මස 31 දින ඉක්මවා තබා ගැනීමට අවසර නොදිය යුතුය.

04. පසුගිය වර්ෂයේදී මෙන් මෙම වර්ෂයේ දී ද ඔබ අමාත්‍යාංශයේ / කාර්යාලයේ මුදල් පොත 2017.12.31.දින 24.00 පැයට හෝ ඊට පෙර ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් නම් කරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් නැවත කිසිදු වවුචරයක් ඇතුළත් කළ නොහැකි වන ලෙස ඉරි ගැසීමෙන් වසා, අත්සන් කර, නම ,තනතුර ,දිනය සහ වේලාවද සටහන් කළ යුතුය. **2017.12.31 දිනට මුදල් පොත වැසීමට හැකි වන පරිදි කල් වේලා ඇතිව වවුචර භාර ගැනීමේ කාල සටහන් ඔබ විසින් පිළියෙල කර ගන්නා ලෙස ඉල්ලා සිටිමි. එසේ වැසීමට පෙර ඔබ කාර්යාලයේ සියළුම අංශ මුදල් අංශය සමඟ ඒකාබද්ධවී සියළුම ගණුදෙනු හා බැරකම් ගිණුම්ගත කර ඇති බවට ඔබ විසින් පෞද්ගලිකවම සෑහීමට පත්විය යුතුය.** එසේ මුදල් පොත වැසීමෙන් අනතුරුව ඉතිරිවන අග්‍රිම ශේෂයට සමාන මුදලට චෙක්පතක්, ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත් සභාව යන නමින් ලියා එය, 2018.01.05 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත එවිය යුතු වේ. 2018 ජනවාරි මස අග්‍රිමය මුදා හරිනු ලබන්නේ මෙම චෙක් පත ලැබීමෙන් පසුව පමණක් බව කරුණාවෙන් සළකන්න. 2017 දෙසැම්බර් මස 31 දිනෙන් පසුව කරන සියළුම වියදම් සඳහා යොදා ගත යුත්තේ 2018 වර්ෂය සඳහා ලබා ගන්නා අග්‍රිමයන් පමණි. **භාණ්ඩ හා සේවා ලබා ගැනීමට පළමුව චෙක්පත් ලියා දීර්ඝ කාලයක් අත රඳවා තබා ගැනීමේ අවස්ථා පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ අවධානයට ලක්වී ඇති නිසා එසේ චෙක්පත් ලියා අත රඳවා ගැනීමෙන් වැළකීමට විශේෂයෙන් වගබලා ගත යුතු වේ.**

05. 2017 මුදල් වර්ෂය සඳහා බස්නාහිර පළාත් සභාවේ පළාත් භාණ්ඩාගාරයේ තබා ගන්නා ගිණුම් 2018 පෙබරවාරි මස 16 දින වසනු ලැබේ. 2017 දෙසැම්බර් මාසය සඳහා වූ පරිපූරක ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරිමට හුදෙක් ඉඩ සැලසීම වස් 2018.02.16 දින දක්වා පළාත් භාණ්ඩාගාර පොත් විවෘතව තබන බව සටහන් කර ගත යුතුවේ. එහෙයින්,

I. ඔබ විසින් 2017 දෙසැම්බර් මාසයට අදාළ ප්‍රධාන ගිණුම් සාරාංශය 2018 <u>ජනවාරි මස වැඩ කරන පලමු දින 05 තුළ පළාත්</u> භාණ්ඩාගාරය වෙත ලැබීමට සැලසිය යුතු වේ.

II. ඒ අනුව 2017 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ ගණුදෙනු ගිණුම්ගත කිරීමෙන් අනතුරුව දෙසැම්බර් මාසය සඳහා වූ ගිණුම් පිළිබඳ පළමු සැසඳීම් වාර්තාව 2018 ජනවාරි 18 වැනි දින හෝ ඊට පෙර ම විසින් නිකුත් කරනු ලැබේ.

III. දෙසැම්බර් මස ප්‍රධාන ගිණුම් සාරාංශයේ ඇතුළත් කිරීමට නොහැකි වූ ලැබීම් හා ගෙවීම් සම්බන්ධ ගිණුම්කරණ වැරදි හෝ පළමු ගිණුම් සැසඳුම් වාර්තාව අනුව සොයා ගන්නා ලද වැරදි නිවැරදි කිරීම් ආදිය ඇතොත් ඒවා ඇතුළත් පරිපූරක ගිණුම් සාරාංශයක් 2018 පෙබරවාරි 15 දිනට හෝ ඊට පෙර පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ හැකිය. පළාත් භාණ්ඩාගාරය විසින් භාර ගනු ලබනුයේ එක් පරිපූරක ගිණුම් සාරාංශයක් පමණක් බවද සැලකිය යුතුවේ.

IV. 2017 මුදල් වර්ෂයට අදාළ 2018 පෙබරවාරි 15 දක්වා වාර්තා කරන ලද සියළුම ලැබීම් හා ගෙවීම්, වැරදි නිවැරදි කිරීම් අඩංගු 2017 දෙසැම්බර් මාසයට අදාළ ගිණුම් පිළිබඳ දෙවන සැසඳීම් වාර්තාව 2018 පෙබරවාරි මස 23 දිනට හෝ ඊට පෙර නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

V. 2017 වර්ෂය සඳහා 2018 පෙබරවාරි මස 15 වැනි දිනට පසුව පළාත් භාණ්ඩාගාරයට ලැබෙන කිසිම ගිණුම් සාරාංශයක් හෝ මු.රී.30 යටතේ මාරු පත්‍ර කිසිදු හේතුවක් නිසාවත් භාර ගනු නොලැබේ.

06. 2017 මුදල් වර්ෂය සඳහා යම් යම් අමාත්‍යාංශ වල /දෙපාර්තමේන්තු වල ගිණුම් පියවීම කෙරෙහි බලපාන යම් යම් තොරතුරු එම අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වෙත සැපයීමට බැඳී සිටින අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු එවැනි තොරතුරු ඔවුන් වෙත නිසි කළට සැපයිය යුතු වේ. එසේ කිරීමෙන් එම තොරතුරු බලාපොරොත්තු වන අමාත්‍යාංශ වලට /දෙපාර්තමේන්තු වලට ස්වකීය ගිණුම් කටයුතු අවසන් කිරීමෙහි ලා ඇති විය හැකි ප්‍රමාදයන් මගහරවා ගත හැකි වේ. මෙම තොරතුරු ලැබීම් ගැන විමසිලිමත් ව සිටීමත්, ඒවා නිසි කලට නොලැබුනහොත් ඉල්ලා ගැනීමත් 2017 මුදල් වර්ෂය සඳහා ස්වකීය ගිණුම් පියවීම පිණිස අවශ්‍ය යම් යම් තොරතුරු වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වලින් බලාපොරොත්තු වන අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල යුතුකම වේ.

07. නියමිත දිනට පෙර අවසන් ගිණුම් සාරාංශයන් හා පරිගණක ගත තැටි ඉදිරිපත් කිරීමේ ලා කිසියම් දුෂකරතාවයක් පවතී නම් ප්‍රමාදයන් වැලැක්වීමට සුදුසු පියවර ගතහැකි වනු පිණිස එම දුෂ්කරතාවය මා වෙත සහ අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාගේ අවධානයට වහාම ලක්කොට අනුමැතිය ලබා ගත යුතුය.

08. 2017 මුදල් ප්‍රකාශයේ තමාට වෙන් කර දී ඇති ප්‍රතිපාදන හෝ වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වෙතින් තමන් වෙත වෙන් කර දී ඇති ප්‍රතිපාදන වලින් යම් ඉතිරිවීමක් ඇත්නම් එම ඉතිරිවීම් කිසිම හේතුවක් නිසාවත් තැන්පත් ගිණුමකට බැර කර රඳවා නොගත යුතුය. එසේම එම ඉතිරි ප්‍රතිපාදන උපයෝගී කරගෙන ඉදිරි වර්ෂයේදී සැපයුම් හා සේවා ලබාගැනීමේ අපේක්ෂාවෙන් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන කිසිම ආයතනයක් වෙත සම්පූර්ණ මුදල් හෝ අත්තිකාරම් වශයෙන් හෝ චෙක්පත් නිකුත් නොකළ යුතු බවද සැලකිල්ලට ගත යුතුය.

09. වෙනත් දෙපාර්තමේන්තු හෝ රජයේ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවලින් ලැබී ඇති ප්‍රතිපාදන පිලිබඳව අදාළ වියදම් වාර්තා හා ප්‍රතිපාදන ඉතිරිවීම් පිළිබඳව විස්තර අදාළ ආයතනවලට නොපමාව සැපයීමට කටයුතු කරන්න. ප්‍රතිපූරණ පදනම මත කරන ලද වැය සියල්ල 2017.12.31 දිනට පෙර ප්‍රතිපූරණය කරගත හැකිවන පරිදි අදාළ රේඛීය අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු සමඟ කටයුතු කළ යුතු වේ.

10. 2017 වර්ෂය සඳහා වූ ඔබ වෙත දී ඇති අග්‍රිමයෙන් කොටසක් 2018 වර්ෂය සඳහා රඳවා ගැනීමට අත්‍යාවශ්‍යම හේතුවක් සඳහා පමණක් අවසර දෙන අතර, ඒ සඳහා 2017.12.15 වැනි දිනට පෙර මාගේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතුවේ. එසේ තබා ගන්නා අග්‍රිම මුදල 2018 ජනවාරි ඔබ වෙත නිකුත් කරන මුල්ම අග්‍රිමයෙන් පියවීමට කටයුතු කළ යුතුවේ.

11. පළාත් මුල්‍ය රීති 476 සහ 2009.11.06 දිනැති මුල්‍ය චක්‍රලේඛ අංක 07/2009 ප්‍රකාර සියළුම කාර්යාල විසින් තම කාර්යාලයේ බඩු බාහිරාදිය ගැන භාණ්ඩ සමීක්ෂණය 2017 වර්ෂය වෙනුවෙන් කළ යුතු අතර, එම වාර්තා නියමිත දිනට පෙර විගණකාධිපති වෙතද ඉදිරිපත් කළ යුතු බවද අවධාරණය කරමි.

එම්.ඒ.බී. දයා සේනාරත්
ප්‍රධාන ලේකම්
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්
බස්නාහිර පළාත.

පිටපත්-

1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ- අභ්‍යන්තර විගණන
3. ප්‍රධාන ලේකම් කාර්යාලයේ සියළුම ශාඛා ප්‍රධානීන් වෙත ( මෙම චක්‍රලේඛයේ උපදෙස් අදාළ විෂය භාර මාණ්ඩලික නිලධාරීන් ට හා විෂය භාර නිලධාරීන්ට දැනුම්දීම සඳහා)
4. ගණකාධිකාරී (ගෙවීම්) - ප්‍රධාන ලේකම් කාර්යාලයේ අග්‍රිමය යටතේ ගෙවීම් සම්බන්ධයෙන් ද මෙම චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කිරීම සඳහා
5. පරිගණක දත්ත සටහන්කරු - වෙබ් අඩවියේ පළ කිරීම සඳහා

**2017 මුදල් වර්ෂය සඳහා ගිණුම් පියවීමට අදාළ**

**විවිධ කාර්යයන් සඳහා නිශ්චිත දිනයන්**

| | |
|---|---|
| • මුදල් පොත පියවීම | 2017 දෙසැම්බර් 31 දින |
| • 2017 දෙසැම්බර් මාසයට අදාළ ගණුදෙනු ඇතුළත් පළමු ගිණුම් සාරාංශය නිකුත් කිරීම. | 2018 ජනවාරි මස වැඩකරන පළමු දින 05 තුළ |
| • 2017 දෙසැම්බර් මාසයට අදාළ ගිණුම් සාරාංශ ඇතුළත් පළමු ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම. | 2018 ජනවාරි 18 දින හෝ ඊට පෙර |
| • ප.මු.රි.30 ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කිරීම සඳහා අනුමැතිය ලබා ගත් මාරු පත්‍ර ගිණුම්ගත කිරීම සඳහා පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම | 2018 පෙබරවාරි 15 දිනට පෙර |
| • අවසන් ගිණුම් සාරාංශය (පරිපූරක)පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම | 2018 පෙබරවාරි 15 දිනට පෙර |
| • පරිපූරක ගිණුම් සාරාංශ අනුව වැරදි නිවැරදි කිරීම් ඇතුළත් අවසන් ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම | 2018 පෙබරවාරි 23 දින හෝ ඊට පෙර |